# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2139/16 - 2019 සැප්තැම්බර් මස 02 වැනි සඳුදා - 2019.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය: එන්සීපී/එච්ජී/එල්02/2544*
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය : 4/3/9/2012/WS/54*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ මින්නේරිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2013.12.20 දිනැති අ. හූ. පි. 09 පිඹුරේ අතුරු පිඹුරු 552හි 710 වැනි පත්‍රයේ කැබලි අංක 7662 නාගලකන්ද හා 7664 මින්නේරිය කැලේ වශයෙන් දැක්වෙන ඉඩමෙහි මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1368ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක:

**කැබලි අංක 7662 - ඉඩමේ නම: නාගලකන්ද; ප්‍රමාණය : හෙක්ටයාර 0.0637.**

උතුරට: 7663 හා 4301 වැනි බිම් කැබලි; නැගෙනහිරට: 4301 හා 3753 වැනි බිම් කැබලි; දකුණට: 3753 හා 7663 වැනි බිම් කැබලි; බටහිරට: 7663 වැනි බිම් කැබැල්ල.

**හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: බී. එල්. ගුණරත්න මහතා, මින්නේරිය ජල පවිත්‍රාගාරය අසල**

**කැබලි අංක 7664 - ඉඩමේ නම: මින්නේරිය කැලේ; ප්‍රමාණය : හෙක්ටයාර 0.0731.**

උතුරට: 7663 හා 7665 වැනි බිම් කැබලි; නැගෙනහිරට: 7665 වැනි බිම් කැබැල්ල; දකුණට: 7665 හා 3753 වැනි බිම් කැබලි; බටහිරට: 3753, 7662 හා 7663 වැනි බිම් කැබලි.

**හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: බී. එල්. ගුණරත්න මහතා, මින්නේරිය ජල පවිත්‍රාගාරය අසල**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 සැප්තැම්බර් මස 30 වැනි දින හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 සැප්තැම්බර් මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ආර්. එම්. ඩී. පී. පුෂ්පකුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
හිඟුරක්ගොඩ.

2019 අගෝස්තු මස 30 වැනි දින
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

9-526

1A - G 30867 – 17 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*